

"ඔබට බලය අවශ්‍ය වන්නේ කිසියම් හිංසාකාරී දෙයක් කිරීම සඳහා පමණ ය. අනෙක් සියලු දේ කර ගැනීම සඳහා ආදරය පමණක් ප්‍රමාණවත් ය"

චාලි චැප්ලින්

## ලියා දන්වන වගයි

### කලාව ආනන්දය සඳහාම පමණක් නොවේ

ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකිකයන් ජීවත්වන සෑම ප්‍රාන්තයකම පාහේ සතිපතා කුමක් හෝ කලා කටයුත්තක් සිදුවෙයි. එක්කෝ සංගීත ප්‍රසංගයකි. පොත් එළිදැක්වීමකි. නාට්‍යයකි. සිනමා පටයකි. රංගන ප්‍රසංගයකි. මේ සියල්ලේ අරමුණ අපේ සමාජයට රසාස්වාදය ලබා දීම පමණක්ම නොවේ.

කලාවේ වැදගත්ම අරමුණ ජනතාවට ප්‍රඥාව ලබා දීමයි. හරි දෙය හරි ලෙස දකින්නට පමණක් නොව ලෝකය දෙස සංවේදීව බලන්නටත් කලාව මිනිසා පොළඹවයි. තම තමන් ගේ සිත් තුළ ගොඩ ගැසී ඇති දහකුත් එකක් දුර්ගුණ පළවා හැර සිත් පිරිසිදු කර ගැනීමේ පෙළඹවීමක්ද කලාවෙන් සිදුවෙයි. මෙසේ වන්නට නම් සමාජයේ ජීවත්වන්නන් ප්‍රඥාවන්තයින් බවට පත්කිරීමේ ශක්‍යතාවක් කලා නිර්මාණ වලට තිබිය යුතුය. එය එසේ සිදුවන්නේද යන්න ගැටලුවකි.

ඕස්ට්‍රේලියාවේ ඇති බොහෝ පුස්තකාල වල සිංහල පොත් සඳහා වෙන්වූ කොටසක්ද ඇත. මේ පුස්තකාල වලින් වැඩපුරම ගෙනයන සිංහල පොත් මොනවාද යන්න පරීක්ෂා කිරීමේදී පෙනී යන වැදගත්ම කාරණය නම් බොහෝ දෙනෙකු තෝරා ගන්නේ සරළ නවකතාය යන්නය. බුද්ධි වර්ධනයට ඉවහල් වන වෙනත් නිර්මාණ කෙරෙහි පාඨක ඇස යන්නේ කලාතුරකිනි.

මේ තරම් කලා නිර්මාණ රස විඳින සමාජය තමාගේ අසල්වැසියා දෙස අනුකම්පාවෙන් බලන්නට තරම් මනසින් උසස් නොවන්නේ මන්ද? වරද ඇත්තේ කොතැනද?

ඕස්ට්‍රේලියාවේ රජය මේ තාක් වරප්‍රසාදයක් ලෙස ජනතාව භුක්ති විඳි මෙඩිකෙයා සහනය වනසා දමන්නට අර අඳියි. වෛද්‍ය පරීක්ෂණ සඳහා මුදල් ගෙවන්නට සිදුවීම දුප්පතුනට මරු පහරකි. ඒ ගැන අනුකම්පාවක් නැති අපේම සහෝදරයෝ කොපමණ වෙත්ද?

එය පසකෙ තිබියේවා. සරණාගතයන් ලෙස මෙරටට එන අපේම ජනතාව දෙස වෛරයකින් බලන අපේ සහෝදරවරු කොපමණ සිටිත්ද? තමා සමග එකට සිටිනා මිනිසුන් කරදරයේ වැටෙන විට ඉවත බලා ගන්නා අපේම මිනිසුන් කොපමණ අපි දැක ඇත්තෙමුද?

මේ සියල්ල අපට පෙන්වා දෙන්නේ කලාවේ අරමුණු ඉටුනොවන බවක් නොවේද? මේ නැවත නැවත අප සිතා බැලිය යුතු කාරණා යයි අපි සිතමු.

### කලු ජූලියන් නැවත නොඇකින්නට

ජූලි මාසය අප සිත් තුළ ලියා ඇත්තේ ඉතා අමිහිරි කතාවකි. මිනිස් සමාජයක කිසිදා සිදු නොවිය යුතු අප්‍රසන්න අත්දැකීම් රැසක් අපි කලු ජූලියේදී විඳ ගත්තෙමු. එය පාඩමකට ගෙන එවැනි දෙයක් කිසිදා අපේ මව් බිමේ සිදු නොවන්නට වග බලා ගැනීම අපේ යුතුකමකි. එසේ තිබියදී තවත් එවැනිම වූ ව්‍යසනයකට රට ඇද දමන්නට වෙහෙසෙන මන්ද බුද්ධිකයන් හමුවේ බුද්ධිමතුන් නිහඬව සිටීම අපි කිසි ලෙසකින් වත් අනුමත නොකරමු. මේ හඬ නැගිය යුතු කාලයයි. වරද සිදුවූ පසු පසුතැවිලි නොවන්නට එය තේරුම් ගැනීම යහපත්ය.

සංස්කාරක



# පරාජය සඳහා සියලු අමුද්‍රව්‍ය දැන් ආණ්ඩුව පැත්තේ

**තිවංක සපරමාදු**

මේ සතියේ බෙන්තොට දී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කැඳවූ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා අනාගත ජාතික මැතිවරණයකට සූදානම් වන ලෙස ඔවුන්ට කීවේය. ඉදිරි ජනාධිපතිවරණයකදී තමා ජයගන්නා බව සහතික බැවින් සහයෝගයෙන් වැඩ කරන්නැයිද ඔහු කීවේය. මේ කතාවේ පේළි අතර ඇති ඇත්ත නම්, ඊළඟ ජනාධිපතිවරණයකදී මහින්ද රාජපක් ෂ මහතා ජයග්‍රහණය කරාවිදැයි කුකුසක් ශ්‍රී ලංකා නිදහස් පක් ෂ මන්ත්‍රීවරුන් අතරම ඇතිව තිබෙන බවත්, ඒ නිසා ජනාධිපතිවරයාට ඔවුන්ගේ සහාය ලැබේදැයි සැකයක් පවතින බවත්, ඔවුන් බෙන්තොටට කැඳවා කතාබහ කළේ ඒ ගැන සහතිකයක් දීමට බවත්ය.

තුන්වැනි ධුර කාලයකට ඉදිරිපත්වීමට ජනාධිපති වරයා සූදානම් වෙමින් සිටින මේ අවස්ථාවේදී මන්ත්‍රීවරුන්ගේ සහාය තමාට ලැබේදැයි ජනාධිපතිවරයාටද කුකුසක් ඇතිවී තිබීම සාධාරණය. දිනන බවට සහතිකයක් දුන් නමුත්, රාජපක්ෂ මහතාගේ ජයග්‍රහණයක් ගැන ඇත්තේ සියයට පනහකටත් අඩු බලාපොරොත්තුවක් බව ශ්‍රීලනිපයම දනියි. හාත්පස බැලුවහොත් දේශපාලන කරුණු බොහොමයක් යෙදී තිබෙන්නේ ජනාධි පතිවරණයකදී මහින්ද රාජපක්ෂ මහතාට අවාසි පැත්තටය. කෙටියෙන් කිවහොත් ඇතුළත් ගැටය. පිටත් ගැටය.

ජනාධිපතිවරයාට තිබෙන එකම සැනසීම විය හැක්කේ තවමත් රාජපක්ෂ පවුලේ අය එකට එකතුව සිටීම ගැනය. තිසරණී ගුණසේකර එක් අවස්ථාවකදී කීවේ රාජපක්ෂවරුන් පරාජය කිරීමේ අවස්ථාවක් උදාවන්නේ ඔවුන්ගේ පවුල එකිනෙකාට පසමිතුරු වූ දාට බවය. ඒ නිසා පවුල එකටම තියාගන්නට ජනාධිපතිවරයා හැමවිටම උත්සාහ කරන බව පෙනෙන්නට තිබෙන අතර, පවුලේ අයද ජනාධිපතිවරයා එම ධුරයේ සිටීමෙන් තම තමන්ට ඇතිවන වාසිසහගත තත්ත්වයන් සලකා බලා කිසිවිටෙකත් පවුලට සතුරු දෙයක් නොකරති. එහෙත්. තිසරණීගේ අනාවැකිය දුර්වලයැයි හිතෙන්නේ, රාජපක්ෂ පවුල එක මිටට තිබියදීත් ඊට පිටතින් පරාජයක් සඳහා අවශ්‍ය වන සියලු අමුද්‍රව්‍ය දැන් එකතුවෙමින් තිබෙන බව දකින විටය. ඒ අමුද්‍රව්‍ය සියල්ල එකතුවී හමාඑන බලවත් සුළඟකට මුවාවෙන්නට කොච්චර එකට හිටියත් රාජපක්ෂ පවුලේ ශක්තිය හොඳටම මදි වනු ඇත.

ජනාධිපතිවරයා බෙන් තොටදී තවදුරටත් කීවේ විරුද්ධ පක්ෂ විසින් ශ්‍රීලනිප සාමාජිකයන් එකිනෙකා කොටවන්නට උපාය යොදන බවත් ඒවාට හසුනොවී පක්ෂය දුර්වල වන්නට ඉඩ නොදී සිටිය යුතු බවත්ය. විරුද්ධ පක්ෂයට එවැනි හයියක් තිබේයැයි ජනාධිපතිවරයා ප්‍රසිද්ධියේ පිළිගැනීමත් එක්තරා පසුබෑමකි.

**රාජපක්ෂවරු ශ්‍රීලනිපය කෑවා**

රාජපක්ෂ ආධිපත්‍යයට එරෙහිව පෙරමුණු කිහිපයකින් දැන් සුළං හමා එයි. පළමුව ලංකා නිදහස් පක්ෂයෙනි. රාජපක්ෂ පවුල ගැන දැන් ශ්‍රීලනිප ජ්‍යෙෂ්ඨයන් සියලු දෙනාම පාහේ ඉන්නේ බලවත් කේන්තියකිනි. දුර කථනයෙන් කතාකරන විට, ප්‍රසිද්ධ රැස්වීම්වලදී ජනාධිපතිතුමාත් රාජපක්ෂ පවුලත් කට පුරා වර්ණනා කරන ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ගෙන් සියයට

4 වන පිටට


# සන්නස

Sannasa
244 Princes Hwy
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**
**S Jayasinghe**
03 8707 4604
0402 025 516
email- Jayasinghe2012@yahoo.com

**Kuma Gamage**
0414 215 280
**email** kuma.sannasa@gmail.com

**Account Details for Payments**

| | |
|---|---|
| **Account Name** | **- Sannasa Media** |
| Bank | - Commonwealth |
| BSB Number | - 063619 |
| Account Number | - 10852409 |

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වී ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
2, Santorini Pl.
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත